## පළමුවන කියැවීම

ක්‍රියා 9:26-31

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**බාර්ණබස්, අපෝස්තුළුවරුන්ට පාවුළු තුමන් හඳුන්වා දෙයි.**

සාවුල් ජෙරුසලමට පැමිණි විට, ගෝලයන් සමග එක් වන්නට උත්සාහ කළේය. එහෙත් ඔහු ගෝලයකැයි විශ්වාස නොකොට සියල්ලෝම ඔහුට බිය වූහ. එවිට බාර්ණබස් ඔහු අතින් අල්ලාගෙන අපෝස්තුළුවරුන් වෙතට කැඳවා ගෙන ගොස්, මාර්ගයේ දී ඔහු ස්වාමින් වහන්සේ දුටු සැටිත්, උන්වහන්සේ ඔහුට කතා කල බවත්, දමස්කයේ දී ජේසුස් වහන්සේගේ නාමයෙන් ඔහු නිර්භීත ලෙස දේශනා කළ සැටිත්, ඔවුන්ට විස්තර කළේය. සාවුල් ද ඔවුන් සමග ජෙරුසලමෙහි සැරිසරමින් ස්වාමින් වහන්සේගේ නාමයෙන් නිර්භීතව කතා කළේය. ඔහු ග්‍රීක බස කතා කළ ජුදෙව්වරුන් සමග සාකච්ඡාවෙහි ද වාද කිරීමෙහි ද යෙදීම නිසා ඔවුහු ඔහු මරන්නට අධිෂ්ඨාන කරගත්හ. සහෝදරයෝ ඒ බව දැන, ඔහු කයිසාරියට ගෙන ගොස් එතැනින් තාර්සසට පිටත් කර යැවූහ. මෙසේ මුළු ජුදයේහි ද, ගලීලයෙහි ද, සමාරියෙහි ද, සභාවට සාමයේ කාලයක් ඇතිවිය. සභාව ශක්ති සම්පන්නව දේව ගෞරවයෙහි ද ශුද්ධාත්ම වරප්‍රසාදයෙහි ද පවතිමින් වැඩි වර්ධනය වූවාය.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 22:25-27, 29-31

පිළිතුර: සමිඳුනි, මහා සභාව මැද අපි ඔබට ප්‍රශංසා කරමු. ආලේලූයා!

ගීය: මහා සභාවේ මාගේ ප්‍රශංසාවේ තේමාව ඔබය. එතුමන්ට ගරුබිය ඇති අය අබිමුව මාගේ භාර ඉටු කරන්නෙමි. දුගී දුප්පතුන් කා බී තෘප්තිමත් වන්නෝය. හිමි තුමන් සොයන්නෝ එතුමන්ට ගී පසස් නගන්නෝය. ඔවුහු සදහටම සෞභාග්‍ය ලබත්වා!

මහ පොළොවේ සතර දිගින් ජනයෝ සමිඳුන් සමරමින් එතුමන් වෙත හැරී එති. සකල ලෝක වාසීහු ඔබ අබිමුව වැඳ වැටෙති. පොළොවෙහි උඩඟු අය එතුමන්ට වැඳ වැටෙනු ඇත. පොළොවේ මැරෙන සුලු අය එතුමන් නමදිනු ඇත.

මාගේ වංශය එතුමන්ට මෙහෙ කරනු ඇත. මතු පරම්පරාවලට සමිඳුන් පිළිබඳ මෙපුවත කියනු ඇත. "එතුමාණෝ මෙසේ කළ සේක"යි කියමින් ඔවුහු මතු ඇති වන පරම්පරාවල එතුමන්ගේ දැහැමි ක්‍රියා පවසනු ඇත.

## දෙවන කියැවීම

1 ජුවාම් 3:18-24

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**උන්වහන්සේගේ ආඥව නම් උන්වහන්සේ ඇදහීමත් එකිනෙකාට ප්‍රේම කිරීමත් ය.**

මාගේ ප්‍රිය දරුවෙනි, අපගේ ප්‍රේමය වචනයෙන් වත් කතාවෙන් වත් නොව, ක්‍රියාවෙන් ප්‍රකාශ වන සත්‍ය ප්‍රේමයක් විය යුතුය. අප සත්‍යයේ පිහිටා සිටින බව දන්නේත්, ඒ ගැන දෙවියන් වහන්සේ ඉදිරියේ අපේ සිතේ සහතිකයක් අපට ඇති විය හැක්කේත් මෙසේ ය. අපේ සිත අපට දෝෂාරෝපණය කරයි නම්, දෙවියන් වහන්සේ අපේ සිතට වඩා උතුම් බවත්, උන්වහන්සේ සියල්ල දන්නා බවත් අපි දනිමු. ප්‍රේමවන්තයෙනි, අපේ සිත අපට දෝෂාරෝපණය නොකරයි නම්, දෙවියන් වහන්සේ ඉදිරියේ අපට බියවීමට කරුණක් නැත. තවද අපි උන්වහන්සේගේ ආඥා පිළිපදින නිසා ද උන්වහන්සේට ප්‍රිය මනාප දේ කරන නිසාද උන්වහන්සේගෙන් ඉල්ලන සියල්ල ලබමු. උන්වහන්සේගේ ආඥව නම් උන්වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ඇදහීමත් උන්වහන්සේ අපට අණ කළ ලෙස එකිනෙකාට ප්‍රේම කිරීමත් ය. උන්වහන්සේගේ ආඥව පිළිපදින්නා උන්වහන්සේ තුළ වෙසෙයි. උන්වහන්සේ ද ඔහු තුළ වැඩවසන සේක. උන්වහන්සේ අප තුළ වැඩවසන බව අප දන්නේ උන්වහන්සේ අපට දුන් ශුද්ධාත්මයාණන් කරණකොටගෙනය. දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 15:4,5

ආලේලූයා! ආලේලූයා!
මා තුළ සිටින්න. මම ද ඔබ තුළ සිටිමි. මා තුළ සිටින තැනැත්තේ
බෙහෝ පල දරන්නේ ය."යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 15:1-8

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**යමෙක් මා තුළ වසන්නේ ද, මම ඔහු තුළ වැඩසිටිම් ද, ඒ තැනැත්තේ බෙහෝ පල දරයි.**

"සැබෑ මිදි වැල මමය; මාගේ පියාණන් වහන්සේ උද්‍යාන පාලකයාණෝය. උන්වහන්සේ, මා තුළ ඇති, පල නොදරන සියලු අතු කපා හරින සේක. පල දරන සියලු අතු, වඩා පල දරන පිණිස පාහින සේක. මා ඔබට වදාළ දහම කරණකොටගෙන ඔබ දැනටම පිරිසිදුය. මා තුළ සිටින්න, මම ද ඔබ තුළ සිටිමි. අත්ත මිදි වැලට යාවී නැත්නම් වෙන්ව පල දරන්නට ඊට නොහැකි සේ, ඔබ මා හා ඒකාබද්ධ නොවන්නහු නම්, පල දැරීමට ඔබට නොහැකිය. මිදි වැල මමය, ඔබ අතුය. යමෙක් මා තුළ සිටින්නේ ද, මම ඔහු තුළ සිටිම් ද, ඒ තැනැත්තේ බෙහෝ පල දරයි. මන්ද, මාගෙන් වෙන්ව කිසිවක් කරන්නට ඔබට නොහැකිය. යම් තැනැත්තෙක් මා තුළ නොසිටින්නේ නම් ඔහු අත්තක් මෙන් පිටත දමනු ලැබ වියළී යයි. වියළි අතු එක්රැස් කොට ගින්නට දමනු ලැබේ; ඒවා දැවී යන්නේය. ඔබ මා තුළ සිටින්නහු නම්, මාගේ වචන ඔබ තුළ පවතී නම්, ඔබ කැමැති දෙයක් අයැදින්න; එය ඔබට දෙනු ලැබේ; මාගේ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන්නේ, ඔබ බෙහෝ සේ පල දරමින් මාගේ ශ්‍රාවකයන් වීමෙන්ය. සුවිශේෂ වාක්‍යය එසේ ය.